DEMAND, SUPPLY, ELASTICITY AND MARKET EQUILIBRIUM

(Part-VII)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

සැපයුම යනු

ආර්ථික විද්‍යාවේ දී සැපයුම යනුවෙන් අදහස් කරන්නේ යම් නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළ කිසියම් භාණ්ඩයක් සඳහා වෙළෙඳපොළේ පැවතිය හැකි විකල්ප මිලයන් හී දී නිෂ්පාදකයන් විසින් සැපයීමට කැමති, සැපයීමට හැකියාව ඇති සහ සපයනු ලබන විවිධ ප්‍රමාණ ය.

සැපයුම වර්ගීකරණය

- ආයතනයක සැපයුම
- වෙළෙඳපොළ සැපයුම

ClassWork.LK

ආයතනය

සම්පත් භාවිත කරමින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කර විකිණීමට ඉදිරිපත් කරන ආර්ථික ඒකකයක් ආයතනයක් නම් වේ.

නිදසුන්:-
විකිණීම සඳහා වී වගා කරන ගොවියෙකි.

ආයතනික සැපයුම

එවැනි ආයතනයක් නිශ්චිත කාලයක් තුළ විවිධ මිල ගණන් යටතේ සැපයීමට කැමති ප්‍රමාණ ආයතනික සැපයුම වේ.

නිදසුන් :-
ඉහත සඳහන් ගොවියා විවිධ මිල ගණන් යටතේවෙළෙඳපොළට අලෙවි කරන වී කිලෝ ග්‍රෑම් ප්‍රමාණ

ClassWork.LK

වෙළෙඳපොළ

යම් භාණ්ඩයක් හෝ සේවාවක් හෝ නිෂ්පාදනය කරන සියලු ආයතනයන්හි එකතුව වෙළෙඳපොළ නම් වේ.

නිදසුන් :-
විකිණීම සඳහා වී වගා කරන සියලු ම ගොවීන්ගේ එකතුව

වෙළෙඳපොළ සැපයුම

එම ආයතන සියල්ල ම නිශ්චිත කාලයක් තුළ අලෙවි කරන ඒකක ප්‍රමාණයන්ගේ එකතුව වෙළෙඳපොළ සැපයුමයි.

නිදසුන් :-
සියලු ම වී ගොවීන් විවිධ මිල ගණන් යටතේ අලෙවි කරන වී කිලෝ ග්‍රෑම් ප්‍රමාණය

ClassWork.LK

ආයතනයක සැපයුම තීරණය කරන සාධක

- සලකා බලන භාණ්ඩයේ මිල (P)

- යෙදවුම් මිල (C)
- තාක්ෂණය (T)

- සම්බන්ධිත භාණ්ඩවල මිල ගණන් (Pn)

- නිෂ්පාදකයන්ගේ අපේක්ෂා (Ex)

- රජයේ ප්‍රතිපත්ති (G)

- වෙනත් සාධක (O)

ClassWork.LK

වෙළෙඳපොළ සැපයුම තීරණය කරන සාධක

- සලකා බලන භාණ්ඩයේ මිල (P)
- යෙදවුම් මිල (C)
- තාක්ෂණය (T)
- සම්බන්ධිත භාණ්ඩ වල මිල ගණන් (Pn)
- නිෂ්පාදකයන්ගේ අපේක්ෂා (Ex)
- වෙළෙඳපොළේ සිටින නිෂ්පාදකයින්ගේ සංඛ්‍යාව (N)
- රජයේ ප්‍රතිපත්ති (G)
- වෙනත් සාධක (O)

ආයතනික සැපයුම තීරණය කරන සාධක වලට අමතර ව වෙළෙඳපොළේ සිටින නිෂ්පාදකයන්ගේ සංඛ්‍යාව වෙළෙඳපොළ සැපයුම තීරණය කරන සාධකවලට එකතු වේ.

ClassWork.LK

ආයතනික සැපයුම් ශ්‍රිතය

කිසියම් භාණ්ඩයක් සඳහා ආයතනික සැපයුම හා එය තීරණය කරන සාධක අතර සම්බන්ධය දක්වන සමීකරණය ආයතනික සැපයුම් ශ්‍රිතය වේ. එය පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.

$$Qs = f\,(P, C, T, Pn, Ex, G, O)$$

වෙළෙඳපොළ සැපයුම් ශ්‍රිතය

කිසියම් භාණ්ඩයක් සඳහා වෙළෙඳපොළ සැපයුම හා එය තීරණය කරන සාධක අතර සම්බන්ධය දක්වන සමීකරණය වෙළෙඳපොළ සැපයුම් ශ්‍රිතය වේ. එය පහත පරිදි ඉදිරිපත් කළ හැකිය.

$$Qs = f\,(P, C, T, Pn, Ex, N\ G, O)$$

ClassWork.LK

සැපයුම් න්‍යාය

සැපයුම තීරණය කරන ඕනෑම සාධකයක් වෙනස් වීම ට අනුකූල ව සලකා බලන භාණ්ඩයේ සැපයුම වෙනස් වන ආකාරය විග්‍රහ කොට දැක්වීම සැපයුම් න්‍යායයි.

සැපයුම් නීතිය

සැපයුම් නීතිය යනු යම් නිශ්චිත අවස්ථාවක දී සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාදක නොවෙනස් ව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිල හා සැපයුම් ප්‍රමාණය අතර පවතින අනුලෝම සම්බන්ධතාවයි.

සැපයුම් නීතිය ඉදිරිපත් කළ හැකි ක්‍රම

- සැපයුම් ලේඛනයක් මගින්
- සැපයුම් වක්‍රයක් මගින්
- සැපයුම් සමීකරණයක් මගින්

ClassWork.LK

සැපයුම් ලේඛනය

සැපයුම් ලේඛනය යනු නිශ්චිත අවස්ථාවක දී සැපයුමට බලපාන අනෙකුත් සාධක ස්ථාවර ව තිබියදී සලකා බලන භාණ්ඩයට පැවතිය හැකි විවිධ මිල ගණන් යටතේ සැපයීමට අපේක්ෂා කරන විවිධ ප්‍රමාණයන් දක්වන සංඛ්‍යා සටහන යි. එය පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.

සලකා බලන භාණ්ඩයේ මිල (රු)	**සලකා බලන භාණ්ඩයේ සැපයුම් ප්‍රමාණය (ඒකක)**
0	0
10	100
20	200
30	300
40	400
50	500
60	600
70	700

ClassWork.LK

සැපයුම් වක්‍රය

දෙන ලද නිශ්චිත අවස්ථාවක දී සැපයුමට බලපාන අනිකුත් සාධක නොවෙනස් ව තිබිය දී සලකා බලන භාණ්ඩයට පවතින විවිධ වූ මිල ගණන් යටතේ සැපයීමට අපේක්ෂා කරන ප්‍රමාණයන් සම්බන්ධ කොට අඳිනු ලබන රේඛාව සැපයුම් වක්‍රය යි. එය පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.



ClassWork.LK

සැපයුම් සමීකරණය

දෙන ලද නිශ්චිත අවස්ථාවක දී සැපයුම කෙරෙහි බලපාන අනිකුත් සාධක නොවෙනස් ව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිල හා සැපයුම් ප්‍රමාණය අතර පවතින අනුලෝම සම්බන්ධතාව වීජීය ප්‍රකාශනයක් මගින් දැක්වීම සැපයුම් සමීකරණය යි.

$$Qs = a + bP$$

Qs = සැපයුම් ප්‍රමාණය (පරායත්ත විචල්‍ය)

a = සැපයුම් වක්‍රයේ තිරස් අන්තඃඛණ්ඩය (මිල 0 දී සැපයුම් ප්‍රමාණය)

b = මිල සංගුණකය(මිල එක් ඒකකයකින් වෙනස් වූ විට සැපයුම් ප්‍රමාණය කොතරම් වෙනස් වනවාද යන්න)

P = සලකා බලන භාණ්ඩයේ මිල (ස්වායත්ත විචල්‍ය)

ClassWork.LK

සැපයුම් නීතියට වැඩි වන ආන්තික පිරිවැය නීතිය බලපාන අයුරු

කිසියම් භාණ්ඩයක් වැඩියෙන් නිෂ්පාදනය කරන විට එහි ආවස්ථික පිරිවැය ද ඉහළ යන බව වැඩි වන ආන්තික පිරිවැය නීතියෙන් කියවේ.

නිමැවුම වැඩි වන විට ආන්තික පිරිවැය ද ඉහළ නගින බැවින් සිය නිෂ්පාදනය වැඩි කිරීමට නිෂ්පාදකයන් පෙලඹෙනුයේ වැඩිවන ආන්තික පිරිවැය පියවා ගැනීමට හැකි වන පරිදි භාණ්ඩයේ මිල ඉහළ නගිනවා නම් පමණි.

ClassWork.LK

2021
2022
2023

උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති
(English & Sinhala Medium)

0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura